{සියලුම හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது / All Rights Reserved / සියලුම හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது }

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாண கல்வித்திணைக்களம் - வடமத்திய மாகாணம்
Department of Education – North Central Province

| 10 ශ්‍රේණිය | තෙවන වාර පරීක්ෂණය 2024 | කාලය : |
|---|---|---|

# නාට්‍ය හා රංග කලාව I, II පිළිතුරු

## I කොටස

| | | | |
|---|---|---|---|
| 01. 2 | 11. 3 | 21. 4 | 31. 3 |
| 02. 4 | 12. 3 | 22. 1 | 32. 1 |
| 03. 2 | 13. 2 | 23. 3 | 33. 2 |
| 04. 3 | 14. 2 | 24. 2 | 34. 4 |
| 05. 4 | 15. 2 | 25. 1 | 35. 2 |
| 06. 2 | 16. 4 | 26. 3 | 36. 4 |
| 07. 3 | 17. 1 | 27. 2 | 37. 3 |
| 08. 2 | 18. 2 | 28. 3 | 38. 3 |
| 09. 2 | 19. 3 | 29. 3 | 39. 4 |
| 10. 4 | 20. 4 | 30. 4 | 40. 2 |

## II පත්‍රය

**01.** (i) මැණිකේ අත්තනායක මහත්මිය (ලකුණු 2)

(ii) කලාගුරු චාල්ස් සිල්වා ගුණසිංහ ගුරුන්නාන්සේ (ලකුණු 2)

(iii) උම්මග්ග ජාතකයේ එන කාලගෝල ප්‍රශ්නය (ලකුණු 2)

(iv) සෙල්ලම් ළමා (සෙල්ල පිල්ලෝ) (ලකුණු 2)

(v) මූලාශ්‍ර කතාවේ පරිදි ප්‍රධාන චරිත යොදාගැනීම, ප්‍රධාන ගැටුම එලෙසම යොදාගැනීම, ප්‍රශ්නය විසඳීමේ ක්‍රමය එක සමාන වීම. (ලකුණු 2)

(vi) මද්දලය, වයලීනය. සර්පිනාව. බටනලාව (ලකුණු 2)

**02.** (i) නාට්‍යයක් යනු යම්කිසි කතා පුවතක්, අවස්ථාවක් හෝ සිද්ධියක් මුල, මැද, අග සහිතව ගොනු කොට වේදිකාව මත නළු නිළියන් විසින් සතර අභිනය මාධ්‍ය කරගෙන ඉදිරිපත් කරන සජීවී සාමූහික කලාවකි.

(ලකුණු 2)

(ii) නෘත්ත යනු අංග වික්ෂේප භාවිත කරන රිද්මයානුකූල හා ශෝභමාන දෘශ්‍ය රූපයක් සහිත තාලාන්විත නැටුමකි/අර්ථ ප්‍රකාශනයෙන් තොර තාලාන්විත නර්තනයකි. (ලකුණු 4)

උදා - ලී කෙළි, කළගෙඩි, කුලු, සවරන් වැනි ජන නැටුම්, උඩරට ශුද්ධ මාත්‍රා, තෙල්මේ නැටුම

නෘත්‍ය යනු රංගනය මගින් කිසියම් අර්ථයක් හෝ භාවයක් ප්‍රකාශ කරන තාලාන්විත නර්තනාංගයකි. භාව ප්‍රකාශනයෙන් යුතු තාලාන්විත නර්තනයකි.

උදා - භරත නාට්‍යම්හි රාධා ක්‍රිෂ්ණා, ශිව පාර්වතී, රාම සීතා වැනි කතා, මුද්‍රා නාට්‍ය, කථක්, කථකලී, මණිපූරි

(iii) රංග කාලයේ හා අවකාශ භාවිතයේ සීමා පැවතීම, වේදිකාව මත නිරූපණය කළ හැකි දේ පමණක් තෝරාගැනීම, චිත්‍ර, සංගීතය,නර්තන වැනි කලා මාධ්‍යයන් නාට්‍යට දායක කරගත හැකි වීම, සෘජු ප්‍රේක්ෂක ප්‍රතිචාර ලැබීම, සක්‍රිය ප්‍රේක්ෂක සහභාගීත්වය, නැවත නැවතත් වෙනස් කළ හැකි වීම, එක් වේලාවක එක් ස්ථානයක පමණක් ප්‍රදර්ශනය වීම, සෑම දර්ශන වාරයක් අවසානයේදී නිෂ්පාදක පිරිස ප්‍රතිලාභ ලැබීම, ගබඩා කළ නොහැකි වීම. ඉහත ලක්ෂණ 3 ක් ලියා විස්තරකර ඇත්නම් සම්පූර්ණ ලකුණු හිමිවේ. (ලකුණු 6)

**03.** (i) රංග අභ්‍යාස යනු නළුවාගේ රංගන කුසලතා වර්ධනය කිරීමටත් කායික මානසික සමබරතාවය ඇති කිරීමටත් සිදුකරන අභ්‍යාස වේ. (ලකුණු 2)

(ii) රංග ක්‍රීඩා - මියෝ මීමෝ, ගස් දෙකේ යුද්ධය, මෝරා සහ මුහුද, ෆෑට් සැලඩ් ක්‍රීඩාව, මකර වල්ගය කැඩීම, මැණික සෙවීම, පෙරළුණු ඔරුව ආදිය (ලකුණු 4)

(iii) රංග අභ්‍යාසවලින් ඇති ප්‍රයෝජන තුනක් ලියා විස්තරකර තිබිය යුතුයි. (ලකුණු 6)

**04.** (i) සිංහල ගැමි නාටකය - එදිරිවීර සරච්චන්ද්‍රයන් (ලකුණු 2)

(ii) පහතරට බෙරය/ යක් බෙරය/ රුහුණු බෙරය/ දෙවොල් බෙරය යන නම් වලින් හඳුන්වා තිබීම.

18 සන්නිය, රට යකුම, සුනියම් යාගය, දෙවොල් මඩු, ගම් මඩු , මහ සොහොන් සමයම (ලකුණු 4)

(iii) නම් කළ ශාන්ති කර්මයට අදාළ අන්තර් රංග අවස්ථා දෙකක් නිවැරදිව නම් කිරීමට - ලකුණු 2

ඉන් එක් අවස්ථාවක නාට්‍යමය ලක්ෂණ උදාහරණ සහිතව විස්තර කිරීමට - ලකුණු 4

**05.** (i) ජන කරළිය/නූතන ජංගම වේදිකාව

පරාක්‍රම නිරිඇල්ල මහතා (ලකුණු 2)

(ii) අන්දර මල්, සීතාම්බර පට, මකර රාක්ෂ, වරන්දාස්, මැටි කරත්තය, කල්පාන්තය (ලකුණු 4)

(iii) පරාක්‍රම නිරිඇල්ල මහතා නාට්‍ය කලාවට පිවිසීම, නාට්‍ය නිර්මාණ, වේදිකා භාවිතයේ අත්හදා බැලීම්, අනෙකුත් නාට්‍යකරුවන් හා එක්ව කළ නාට්‍ය සේවාවන් සඳහන් කර ඇත්නම් සම්පූර්ණ ලකුණු හිමිවේ.(ලකුණු 6)

**06.** (i) සොකරි - කමත

කෝලම් - කෝලම් සබය, තානායම්පොළ (ලකුණු 2)

(ii) සමතලා බිමක් වීම, රංගනයට ප්‍රමාණවත් අවකාශයක් තිබීම, ප්‍රේක්ෂකයින්ට පහසුවෙන් නැරඹිය හැකි ස්ථානයක පිහිටා තිබීම, ශිල්පීන්ට අවශ්‍ය අවම පහසුකම් හෝ තිබීම. (ලකුණු 4)

(iii) නළු නිළියන්ට තම ප්‍රවේශන ස්ථාන හඳුනා ගැනීමට, නිෂ්ක්‍රමණ ස්ථාන හඳුනා ගැනීමට, අවශ්‍ය රංගාලෝකය වෙත ස්ථානගත වීමට, විශේෂ රංග ප්‍රයෝග සඳහා අනුගත වීමට වැනි කරුණු 3 ක් විස්තර කිරීම ප්‍රමාණවත් ය. (ලකුණු 6)

**07.** (i) පසුබිම, කාලය, චරිත මැවීමට අවශ්‍ය පරිදි රංග විධාන සමග සංවාද රචනා කිරීම සඳහා (ලකුණු 4)

(ii) චරිත අතර ගැටුමක් ඇතිවන අයුරින් අවස්ථාව ගොඩනැගීම සඳහා (ලකුණු 4)

(iii) නොසිතූ පෙරළියක් සහිතව නාට්‍යෝචිත අවස්ථාවක් නිර්මාණය කිරීම සඳහා (ලකුණු 4)

CamScanner